SLGURU.LK

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2026
Third Term Test - Grade 12 - 2026

විභාග අංකය: .....

ශ්‍රී ලංකා ඉතිහාසය - I

කාලය පැය 01 යි

- **අංක 1-10 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම හඳුනාගෙන එහි අංකය තිත් ඉර මත ලියන්න.**

(01) (1) ඔනෙසික්‍රීටස් (2) මෙගස්තිනීස් (3) චෙංහෝ
(4) මෙගස්තිනීස් (5) ප්ලිනි (.....)

(02) (1) මිනිහාගල්කන්ද (2) බෙල්ලන්බැඳි පැලැස්ස (3) පතිරාජවෙල
(4) බටදොඹලෙන (5) අලුලෙන (.....)

(03) (1) වංසප්ථප්පකාසිනි (2) සමන්තපාසාදිකාව (3) මහෝරථසූරණි
(4) සම්මෝහ විනෝදනී (5) සුමංගල විලාසිනි (.....)

(04) (1) කච්සිඑමිණ (2) සසදාවත (3) මුවදෙව්දාවත
(4) අමාවතුර (5) ධර්ම ප්‍රදීපිකාව (.....)

(05) (1) ගෝකණ්ණතිත්ථ (2) සුකරතිත්ථ (3) මහාතිත්ථ
(4) කච්ඡකතිත්ථ (5) ලංකා පට්ටන (.....)

(06) (1) සේන ගුත්තික (2) එළාර (3) ශ්‍රී මාර වල්ලභ
(4) බුද්ද පාරින්ද (5) පුලහත්ථ (.....)

(07) (1) දඹුල්ල පර්වත ලිපිය (2) අඹගමුව සෙල්ලිපිය (3) ගල්පොත සෙල්ලිපිය
(4) රන්කොත් විහාර ටැම් ලිපිය (5) රඹෑව පුවරු ලිපිය (.....)

(08) (1) කලාවැව (2) හුරුළු වැව (3) මින්නේරිය වැව
(4) කවුඩුල්ල වැව (5) මහගල්කඩවල වැව (.....)

(09) (1) නිශ්ශංකමල්ල (2) විජයබාහු (3) වික්‍රමබාහු
(4) සහස්සමල්ල (5) චෝඩගංග (.....)

(10) (1) චූල සීවලී දේවි (2) අනුලා දේවි (3) සුගලා දේවි
(4) ලීලාවතී (5) කළ්‍යාණවතී (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැලපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

(11) (1) බෝවත්තේගල සෙල්ලිපිය - ප්‍රාදේශීය රජ පෙළපත් පිළිබඳව
(2) ගොඩවාය සෙල්ලිපිය - වරාය බදු පිළිබඳව
(3) හෝපිටිගමු ටැම් ලිපිය - වෙළඳ ගමක පරිපාලනය පිළිබඳව
(4) දෙවනගල සෙල්ලිපිය - ඉඩම් ප්‍රදානයක් පිළිබඳව
(5) තෝනිගල සෙල්ලිපිය - වසභ රජුගේ පුතුන් පිළිබඳව (.....)

(12) (1) මෝරිය පෙළපත - ධාතුසේන රජතුමා
(2) ලම්භකර්ණ පෙළපත - වසභ රජතුමා
(3) කාලිංග පෙළපත - පළමුවන පරාක්‍රමබාහු රජතුමා
(4) ආර්ය චක්‍රවර්ති පෙළපත - කණකශූරීය ශිංගෙයි ආරියන්
(5) දඹදෙණි පෙළපත - තුන්වන විජයබාහු රජතුමා (.....)

(13) (1) මධුරාපුර කුමරිය - මාතොට
(2) පණ්ඩුවාසදේව - කම්මල්තොට
(3) භද්දකච්චායනා - ගෝකණ්ණ
(4) සංඝමිත්තා තෙරණිය - කළ්‍යාණි
(5) හේමමාලා සහ දන්ත - ලංකා පටුන (.....)

(14) (1) එළාර - වේළුසුමන
(2) දුටුගැමුණු - නන්දිමිත්‍ර
(3) ධාතුසේන - මිගාර
(4) හතරවන මිහිඳු - සේන
(5) පළමුවන පරාක්‍රමබාහු - ලංකාපුර (.....)

(15) (1) සාරාර්ථ සංග්‍රහය - බුද්ධදාස රජ
(2) ජනාකීහරණය - කුමාර ධාතුසේන රජ
(3) දම්පියා අටුවා ගැටපදය - දෙවන පරාක්‍රමබාහු රජ
(4) අමාවතුර - ගුරුළුගෝමී
(5) සද්ධර්මරත්නාවලිය - ධර්මසේන හිමි (.....)

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දිනවකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දිනවකවානු X තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයක ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැලපෙන අනු පිළිවෙලට නොවේ. X තීරය, Y තීරය සමඟ ගැලපෙන අනුපිළිවෙලට සකස් කළවිට පහත දී ඇති සංයෝග පහෙන් එකක් වැරදිය. නිවැරදි සංයෝගනයට ගැලපෙන අංකය තෝරා ලියන්න.**

(16)

X	Y
(1) රොබට් නෝක්ස්	A ලංකාධිපත්‍ය
(2) ක්වේරෝස්	B ලංකා දිවයින පිළිබඳ විස්තරයන්
(3) එමර්සන් ටෙනන්ට්	C ලංකා පුරාවෘත්තය
(4) ජෝන් ඩොයිලි	D එදා හෙළදිව
(5) බැල්දියස්	E සිංහලේ ආණ්ඩු ක්‍රමය

(1) DABEC (2) DBAEC (3) DACEB (4) DEACB (5) DABCE (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(17)

X	Y
(1) මයුරපාද පිරිවෙන	A තොටගමුව
(2) පද්මාවතී පිරිවෙන	B දෙවිනුවර
(3) විජයබාහු පිරිවෙන	C වාතිරිගල
(4) සුනේත්‍රාදේවි පිරිවෙන	D කෑරගල
(5) ඉරුගල් කුලතිලක පිරිවෙන	E පැපිලියාන

(1) EDABC (2) DEACB (3) CBDAE (4) CDAEB (5) BEADC (.....)

(18)

X	Y
(1) සිඛවළඳ හා සිඛවළඳ විනිස	A පොළොන්නරු යුගය
(2) බුත්සරණ	B කුරුණෑගල යුගය
(3) කව්සිළුමිණ	C අනුරාධපුර යුගය
(4) දළදා සිරිත	D කෝට්ටේ යුගය
(5) ගුත්තිලකාව්‍ය	E දඹදෙණි යුගය

(1) CADEB (2) CABED (3) CAEDB (4) CADBE (5) CAEBD (.....)

(19)

X	Y
(1) මිහින්තලේ පුවරු ලිපිය	A විදේශීය වෙළෙඳුන් සඳහා නැව් තොටක තොරතුරු
(2) වේවැල් කැටිය පුවරු ලිපිය	B උතර සහ දුටග ප්‍රාදේශීය රජවරු පිළිබඳව
(3) නයිනතිව් දෙමළ සෙල්ලිපිය	C පළමුවැනි පරාක්‍රමබාහු හා දෙවන ගජබාහු රජවරුන් ඇතිකරගත් ගිවිසුම
(4) හබැස්ස සෙල්ලිපිය	D ග්‍රාමීය අධිකරණ කටයුතු පිළිබඳ නීති
(5) සංගමු විහාර සෙල්ලිපිය	E විහාරගම් පාලනය පිළිබඳ නීති

(1) EDABC (2) EDBAC (3) EDCAB (4) EDCBA (5) ECDBA (.....)

(20)

X	Y
(1) දේවානම්පියතිස්ස රජ සමය	A බුදුන් වහන්සේගේ දන්ත ධාතුව වැඩමකරවීම.
(2) මහානාම රජ සමය	B පත්තිනි ඇදහිල්ල හඳුන්වා දීම.
(3) සිරි මේඝවණ්ණ රජ සමය	C ධම්මධාතුව නම් මහායාන ග්‍රන්ථය ගෙන්වීම.
(4) සිලාකාල රජ සමය	D ජය ශ්‍රී මහා බෝධියේ ශාඛාව වැඩම කරවීම.
(5) පළමුවන ගජබාහු රජ සමය	E හෙළ අටුවා පාලියට නැගීම.

(1) DECBA (2) DEBCA (3) DEACB (4) DAEBC (5) DCBAE (.....)

- **අංක 21 සිට 25 දක්වා සෑම ප්‍රශ්නයකට එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එක්ක අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

(21) පණ්ඩුකාභය රජ සමය

(1) බලයට පැමිණීමට යක්ෂ ගෝත්‍රිකයන්ගේ සහාය හිමිවිය.
(2) ප්‍රථම වරට අනුරාධගාමය අනුරාධපුර නගරය බවට පත් කළේය.
(3) ආර්ය ජන කොටස් හා ස්වදේශීය ගෝත්‍රික ජන කොටස් අතර පැවති පරතරය නැති කිරීම.
(4) බුදු දහමට රාජ්‍ය අනුග්‍රහය ලබා දීම.
(5) ප්‍රථමවරට වැව් ඉදිකිරීමට රාජ්‍ය අනුග්‍රහය ලබා දීම. (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(22) රෝහණ රාජධානිය

(1) රෝහණ රාජධානිය ආරම්භ කරනු ලබන්නේ අනුරාධපුර රජ පෙළපතේ සාමාජිකයකු වූ මාහානාග විසිනි.

(2) මහානාග මාගම මුල්කරගෙන නව රාජධානියක් ආරම්භ කරන විටත් කතරගම ක්ෂත්‍රීය පාලකයන් සිටියහ.

(3) රෝහණයේ බලය වෙනුවෙන් ඇති වූ ගැටුමේ දී මාගම ගෝඨාභය රජතුමා කතරගම ක්ෂත්‍රීයයන් සාතනය කළේය.

(4) කාවන්තිස්ස රජතුමා රෝහණ රාජධානියේ බල ව්‍යාප්තිය පුළුල් කළේ ය.

(5) දුටුගැමුණු රජතුමා සේරු හා සෝම යන ප්‍රාදේශීය පාලන ඒකක රෝහණයට ඇඳා ගත්තේ ය. (.....)

(23) රජරට චෝළ පාලනය

(1) ක්‍රි. ව. 1017 දී අනුරාධපුර යටත් කරගත් චෝළයෝ රජරට චෝළ පාලනය තහවුරු කළහ.

(2) කාලිංග මාඝ විසින් එම ආක්‍රමණය මෙහෙයවන ලදී.

(3) පොළොන්නරුව අගනුවර ලෙස ප්‍රකාශයට පත්කර එය ජනනාථ මංගලම් ලෙස නම් කළහ.

(4) චෝළ පරිපාලනය යටතේ ලංකාවේ උතුරු කොටස මුම්මුඩි ශෝල මණ්ඩලම් ලෙස හඳුන්වන ලදී.

(5) චෝළ පාලනය හමුදාමය පාලනයක් ලෙස පවත්වාගෙන ගියබව පැහැදිලි වේ. (.....)

(24) කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා මුහුණ දුන් අභියෝග

(1) සිංහාසනය වෙනුවෙන් පාණ්ඩ්‍ය වංශිකයන් උරුමකම් ඉදිරිපත් කිරීම.

(2) විදේශිකයකු බැවින් ස්වදේශික ගොවි කුලයෙන් එල්ල වූ අභියෝග.

(3) රුහුණේ අභියෝග ජය ගැනීම.

(4) කාලිංග පෙළපත නිසා ඇති වූ අභියෝග

(5) භික්ෂූන්වහන්සේලාගේ ප්‍රතික්ෂේප කිරීම් නිසා සංඝ සමාජයෙන් එල්ල වූ අභියෝග (.....)

(25) අනුරාධපුර යුගයේ එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ

(1) පළමු ආක්‍රමණය සූරතිස්ස රජතුමාගේ කාලයේ දී සේන හා ගුත්තික යන අස් වෙළෙඳුන් දෙදෙනා විසින් සිදු කිරීම.

(2) ආක්‍රමණිකයන් බලය අත්පත් කර ගැනීමෙන් පසුව අනුරාධපුරයේ සිට පාලනය ගෙය යෑම.

(3) ආක්‍රමණ වැඩි ප්‍රමාණයක් චෝළයින් විසින් සිදු කිරීම.

(4) ලංකාවට එල්ල වූ ආක්‍රමණවල පසුබිම බලන විට අභ්‍යන්තර බල අරගලය හෝ දුර්වල පාලකයින් බලයට පත් වූ විට සිදු වූ ඒවා බව පෙනී යෑම.

(5) දකුණු ඉන්දියානු ආක්‍රමණ සඳහා වැඩි වශයෙන් නැගෙනහිර ගෝකණ්ණතිත්ථ වරාය භාවිත කර තිබීම. (.....)

- **අංක 26 - 30 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (A), (B), (C) සහ (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරන්න.**

A සහ B පමණක් නිවැරදි නම් 1 ද,
A සහ C පමණක් නිවැරදි නම් 2 ද,
B සහ C පමණක් නිවැරදි නම් 3 ද,
D සහ D පමණක් නිවැරදි නම් 4 ද,
වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම්, 5 ද, **වරහන තුළ ලියන්න.**

උපදෙස් සම්පිණ්ඩනය

1	2	3	4	5
(A) සහ (B) පමණක් නිවැරදිය.	**(A) සහ (C) පමණක් නිවැරදිය.**	**(B) සහ (C) පමණක් නිවැරදිය.**	**(C) සහ (D) පමණක් නිවැරදිය.**	**වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදිය.**

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(26) ශ්‍රී ලංකාවේ ජනාවාස පිහිටුවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?

A ඉන්දියාවේ ප්‍රදේශ කිහිපයකින් පැමිණි සංක්‍රමණික පිරිස් විසින් මුල් ජනාවාස පිහිටුවන ලදී.

B ලංකාවට වරින් වර පැමිණි වෙළෙඳුන් විසින් ලංකාව ජනාවාස කරන ලද බව ඇතැම් මූලාශ්‍ර වලින් හෙළි කරයි.

C මුල් ම ජනාවාසය ලංකාවේ උතුරේ නකදිව පිහිට වූ බව වංශකතාවලින් තොරතුරු දක්වයි.

D ලංකාවට පැමිණි හියුංසියැං හිමි පවසන්නේ ලංකාවේ ජනාවාස පිහිටුවීම ක්‍රි. පූ. 7 වන සියවසේ පමණ සිදු වූ බවකි. (.....)

(27) ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?

A මුල් ම වාරි කර්මාන්තය ගම්වැව් ඉදි කිරීමෙන් ආරම්භ විය.

B නුවර වැව නාගරික ජල අවශ්‍යතා ඉටු කිරීම වෙනුවෙන් ඉදි කරන ලද බවට විශ්වාස කෙරේ.

C මහවැව් තැනීමේ වාරි කර්මාන්ත තාක්ෂණය වසභ රාජ්‍ය සමයේ දී ආරම්භ විය.

D පුරාණ වාරි කර්මාන්තවල වර්ධනයේ උච්චතම අවස්ථාව සමුද්‍ර සංකල්පයයි. (.....)

(28) මහසෙන් රජතුමා සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?

A ගෝඨාභය රජතුමාගේ කණිටු පුත්‍රයායි.

B අභයගිරිය ඉදිකර කුපික්කලතිස්ස තෙරණුවන්ට පිදීමෙන් පළමු නිකාය බේදනයට මුල පිරුවේ ය.

C සංඝමිත්‍ර ගුරුවරයාගේ අවශ්‍යතාවයට අනුව මහා විහාර විරෝධී ප්‍රතිපත්තියක පිහිටා කටයුතු කළේ ය.

D ගෝඨාභය රජතුමාගේ පාලන සමයේ පළමුවරට රජරටට පාණ්ඩ්‍ය ආක්‍රමණයක් එල්ල විය. (.....)

(29) පළමුවන විජයබාහු රජතුමාගේ කාර්ය සංසිද්ධීන් සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?

A වාරි කර්මාන්ත දියුණු කිරීම සඳහා විශාල දායකත්වයක් ලබා දුන්නේ ය.

B චෝළයින්ට එරෙහිව සංවිධානාත්මකව සේනාව මෙහෙයවා චෝළ පාලනය අවසන් කළේ ය.

C ඉන්දියානු සහ අග්නිදිග රටවල පාලකයන් සමඟ සමීප සබඳතා පවත් ගැනීමෙන් රටේ ආරක්ෂාවට රාජ්‍ය තාන්ත්‍රික සහය ලබා ගැනීම.

D චෝළ විරෝධී සටනට පාණ්ඩ්‍ය සේනා ආධාර ලබා ගත්තේය. (.....)

(30) පැරණි ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?

A පොළොන්නරු යුගයේ දී ශ්‍රී ලංකාව හා යුරෝපය අතර සෘජු වාණිජ සබඳකම් පැවතුණි.

B අනුරාධපුර යුගයේ දී මහාතිත්ථ වරාය ප්‍රමුඛ වරායක් විය.

C ආරම්භයේ පටන් ශ්‍රී ලංකාව හා දකුණු ඉන්දියාන අතර සමීප වෙළඳ සබඳතා තිබුණි.

D ලංකාවෙන් චීනයට අපනයනය කළ භාණ්ඩ අතර අශ්වයන් සහ රෙදි පිළි ද විය. (.....)

- **අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

(31) මහින්දාගමනය සනාථ කරන සෙල්ලිපිය කුමක් ද?

(1) රජගල සෙල්ලිපිය (2) තෝණිගල සෙල්ලිපිය (3) කතරගම සෙල්ලිපිය
(4) මහාඇලගමුව සෙල්ලිපිය (5) ගොඩවාය සෙල්ලිපිය (.....)

(32) රජරට හේන් වගාවෙන් අය කළ බද්ධ කුමක් ද?

(1) දකපති (2) බොජකපති (3) මතෙර මපිබක
(4) කෙටු කනබ අය (5) කැතිඅඩ (.....)

(33) පළමුවැනි පරාක්‍රමබාහු රජතුමාගේ බුරුම ආක්‍රමණය සනාථ කරන සෙල්ලිපිය කුමක් ද?

(1) වල්ලිපුරම් රන් සන්නස (2) සංගමු විහාර ලිපිය (3) දෙවනගල සෙල්ලිපිය
(4) රන්කොත් විහාර ලිපිය (5) බඹරගල සෙල්ලිපිය (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(34) යාපනය රාජධානියේ ප්‍රථම ආර්යචක්‍රවර්ති රජතුමා කවු ද?

(1) විජය කුලංකෙයි (2) සංකිලි (3) අරිට්ඨ කී වෙණ්ඩු පෙරුමාල්

(4) පරරාජසේකරම් (5) වික්කිරම (.....)

(35) හය වන බුවනෙක බාහු නමින් කෝට්ටේ රාජධානියේ රජ වූයේ කවු ද?

(1) කීර්ති කුමරු (2) සපුමල් කුමරු (3) දේවරාජසිංහ කුමරු

(4) ජයබාහු කුමරු (5) අම්බුළුගල කුමරු (.....)

- **අංක 36 - 40 දක්වා ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශනය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 , 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංක වරහන් තුළ ලියන්න.**

	පළමු ප්‍රකාශය	**දෙවැනි ප්‍රකාශය**
1	නිවැරදිය	වැරදිය
2	නිවැරදිය	නිවැරදිය
3	වැරදිය	වැරදිය
4	වැරදිය	නිවැරදිය
5	නිවැරදිය	නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි.

	පළමු වැනි ප්‍රකාශනය	දෙවැනි ප්‍රකාශනය	
(36)	දීපවංශයට ලියන ලද ටීකාව සම්මෝහවිනෝදනිය වේ.	සිරි මේඝවණ්ණ රජ සමයේ දී දන්ත ධාතුව ලංකාවට වැඩම කරවන ලදී.	(.....)
(37)	ධාතුසේන රජුගේ පාලන සමයේ දී ලංකාවේ මහායාන ඉගැන්වීම් ඇති වූ බව වංසකතාවල දැක්වේ.	සීගිරය දළදා වහන්සේ සඟවා තැබූ ආරක්ෂිත ස්ථානයකි.	(.....)
(38)	බුද්ධාගම මෙරට ස්ථාපිත කිරීමට නම් මෙරට උපන්නකු මෙරට දී විනය ඉගෙනගෙන විනය දේශනා කළයුතු යැයි මිහිඳු හිමයෝ වදාළහ.	ශ්‍රී ලංකව තුළ සංවිධානාත්මක ආගමක් නොවීමත් බුදු දහම අවිහිංසාවාදී ආගමක් වීමත් හේතු කොටගෙන ඉතා ඉක්මනින් ජනතා විශ්වාසය දිනාගත් අතර රාජ්‍ය අනුග්‍රහය ලැබීම නිසා ලංකාවේ ප්‍රධාන ආගම බවට බුදු දහම	(.....)
(39)	ගම්පොල රාජධානියේ ආරම්භක පාලකයා හතරවන බුවනෙකබාහු රජතුමාය.	සේනාධිලංකාර සෙනෙවිරත් පවුල සහ අළගක්කෝණාර හෙවත් අලකේෂ්වර පරපුර කෝට්ටේ රාජ සභාවේ බලවත් ප්‍රභූ පවුල් දෙකක් වූහ.	(.....)
(40)	රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසුව වියළි කලාපයේ වනගතව හුදෙකලාව ගොඩ නැඟුණු කුඩා ප්‍රාදේශිය පාලන ඒකක වන්නි පාලන ඒකක ලෙස හැඳින්වේ.	රාජධානි නිරිත දිගට සංක්‍රමණය වීමෙන් පසුව දඹදෙනිය සෙසු රාජධානි අභිබවා නැගී ඒමට තුන්වන විජයබාහු රජුට දළදා වහන්සේගේ භාරකාරත්වය ලැබීමට ප්‍රධාන හේතුවක් විය.	(.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2026
Third Term Test - Grade 12 - 2026

විභාග අංකය: .....

ශ්‍රී ලංකා ඉතිහාසය – II

කාලය පැය 03 යි

උපදෙස් :

පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.

- **II කොටස A, B හා C ලෙස කොටස් තුනකින් සමන්විත වේ.**
- **A කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් එක ප්‍රශ්නයක්වත් තෝරා ගෙන තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ දළ සිතියමක් I කොටස සමඟ සපයා ඇත.**

A කොටස

01.

(i)	ගෝකණ්ණ	(v)	කලා වැව	(ix)	මඩකලපුව
(ii)	පොම්පරිප්පු	(vi)	මධ්‍යම පළාත	(x)	කෝට්ටේ
(iii)	මැණික් ගඟ	(vii)	කළුතර	(xi)	සීතාවක
(iv)	පොළොන්නරුව	(viii)	නාච්චදූව වැව	(xii)	සීගිරිය

(නිවැරදි ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි)

B කොටස

02. ''මහසෙන් රාජ්‍ය සමයේ අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීම සඳහා භාවිත කල හැකි ප්‍රධානත ම සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ මහා වංශයයි.''

(i) මහා වංශයේ කතුවරයා නම් කරන්න. (ලකුණු 01)

(ii) මහා වංශයට ලියන ලද ටීකාව නම් කරන්න. (ලකුණු 01)

(iii) මහා වංශය ලිවීම සඳහා යොදා ගන්නට ඇතැයි සැලකෙන සාහිත්‍ය මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iv) අනුරාධපුර යුගයේ දේශපාලන ඉතිහාසය හැදෑරීම සඳහා මහාවංශයේ ඇති වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 06)

(v) ''අභිලේඛන මූලාශ්‍ර නොමැති වූයේ නම් මහා වංශය ඓතිහාසික වෘත්තාන්තරයකින් පමණක් වන්නට ඉඩ තිබුණි.'' විමසන්න. (ලකුණු 06)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

03. ''දේවානම්පියතිස්ස රජ සමය මෙරට ආගමික හා දේශපාලනික වශයෙන් සුවිශේෂී වෙනස්කම් රැසක් ඇති කිරීමට සමත් වූ කාලවකවානුවකි.''

(i) මහා වංශයෙහි සඳහන් වන අන්දමට දේවානම්පියතිස්ස රජුගේ පූර්වගාමී පාලකයින් දෙදෙනා නම් කරන්න. (ලකුණු 02)

(ii) දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ බුදු දහම තහවුරුවන තෙක් පැවති බෞද්ධ ඇදහිලි පිළිබඳව පරීක්ෂා කරන්න. (ලකුණු 05)

(iii) දේවානම්පියතිස්ස රජ සමයේ මෙරට දේශපාලන හා සංස්කෘතික වශයෙන් ඇති වූ වර්ධනය විමසන්න. (ලකුණු 09)

04. ''පළමුවෙනි විජයබාහු රජතුමා ලංකා ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ රජ කෙනෙකු වශයෙන් සැළකෙන්නේ අඩසිය වසකටත් වඩා පැවති විදේශාධිපත්‍යයෙන් දිවයින මුදවාගෙන රටේ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කළ බැවිනි.''

(i) පළමුවන විජයබාහු රජතුමා පිළිබඳව තොරතුරු හෙළිදරව් කරන ප්‍රධාන අභිලේඛනය කුමක් ද? (ලකුණු 01)

(ii) පළමුවන විජයබාහු රජතුමාගේ විශේෂ ඇගයීමකට පාත්‍ර වූ රුහුණු රට දණ්ඩනායකවරයා කවු ද? (ලකුණු 06)

(iii) රෝහණය ජයගෙන පළමුවන විජයබාහු නමින් බලය තහවුරු කරගත් ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 06)

(iv) ඉහත ප්‍රකාශය කෙරෙහි අවධානය යොමු කරමින් පළමුවන විජයබාහු රජතුමාගේ දේශපාලන කාර්ය සාඵල්‍යය සාකච්ඡා කරන්න. (ලකුණු 08)

05. රජරට ශිෂ්ටාචාරයේ පැවති ආර්ථික තත්ත්වය පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ සාකච්ඡා කරන්න.

(i) වාරි කර්මාන්තය මත පදනම් වූ කෘෂිකාර්මාන්තය (ලකුණු 08)

(ii) වෙළඳාම (ලකුණු 08)

06. ''දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ පාලන සමය පහත දැක්වෙන තේමා යටතේ පරීක්ෂා කරන්න.

(i) විදේශ ආක්‍රමණ මැඩ පැවැත්වීම.

(ii) සංස්කෘතික ප්‍රබෝධය (ලකුණු 16)

07. යාපනය රාජධානියේ ආරම්භය හා වර්ධනය විමසන්න. (ලකුණු 16)

08. රාජධානි නිරිත දිගට සංක්‍රමණය වීමෙන් පසුව ආර්ථිකයෙහි ඇතිවූ වෙනස්කම් පරීක්ෂා කරන්න. (ලකුණු 16)

09. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) වසභ රජතුමා.

(ii) පොළොන්නරු යුගයේ විදේශ ප්‍රතිපත්තිය.

(iii) ගම්පොළ යුගයේ කලාව හා සාහිත්‍යය.


(iv) 6 වන පරාක්‍රමබාහු රජතුමා.

(එක් කෙටි සටහනකට ලකුණු 08 බැගිනි.)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

- අංක 01 ප්‍රශ්නය සඳහා අදාළ ශ්‍රී ලංකාවේ ආකෘති සිතියම.



SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

“The roots of education are bitter, but the fruit is sweet.” — Aristotle (commonly attributed)

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK
For Educational Purpose Only